# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 6 ශ්‍රේණිය | ජලය ස්වභාවික සම්පතක් ලෙස | ඒකකය - 03 |
|---|---|---|

- වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1). ජලයේ ඝන, ද්‍රව හා වායු යන භෞතික අවස්ථා පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. ජල වාෂ්ප, ද්‍රව ජලය හා අයිස්
2. අයිස්, ද්‍රව ජලය හා ජල වාෂ්ප
3. ද්‍රව ජලය, අයිස් හා ජල වාෂ්ප
4. ද්‍රව ජලය, ජල වාෂ්ප හා අයිස්

(2). භූගත ජලය රැස්වී ඇති ස්ථානයක් ලෙස සැලකිය හැක්කේ,
1. සාගරය 2. පොකුණු 3. ළිං 4. වැව්

(3). පෘථිවි පෘෂ්ඨයේ ඇති ජලයෙන් අපට පරිභෝජනය කළ හැකි ජල ප්‍රතිශතය වන්නේ,
1. 0.01% 2. 70% 3. 97.41% 4. 10%

(4). කරදිය අඩංගු ජලාශ වන්නේ,
1. සාගර හා මුහුදු 2. කලපු හා බොකු 3. ළිං හා පොකුණු 4. ගංගා හා ඇළ දොළ

(5). පහත සඳහන් වගන්ති අතුරින් ජලය පිළිබඳ සත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. ලවණතාවය පදනම් කර ගෙන ජලය අයිස්, ද්‍රව ජලය සහ හුමාලය ලෙස වර්ග කර ඇත.
2. වර්ෂණය, මතුපිට ජලය සහ භූගත ජලය යනු ජලය පවතින විවිධ ආකාර වේ.
3. පෘථිවි පෘෂ්ඨයේ පවතින ජලයෙන් 70%ක් පමණ ප්‍රයෝජනයට ගතහැකි ජලය වේ.
4. ග්ලැසියර් යනු ජලය වාෂ්ප ලෙස පවතින ආකාරයකි.

(6). ශාකයකට ජලය ප්‍රයෝජනවත් වන අවස්ථාවක් වන්නේ,
1. ශාකයට ඛනිජ ලවණ උරා ගැනීමට
3. ශාකය ඍජුව පවත්වා ගැනීමට
3. ශාක පත්‍රවල ආහාර නිෂ්පාදනයට
4. ඉහත සඳහන් කාර්යයන් සියල්ලටම

(7). ජල දූෂණය ලෙස හැඳින්වෙන්නේ,
1. ජලාශවල ජල මට්ටම ඉහළ යාම
2. ජලාශවල ජලජ ජීවීන් වර්ධනය වීම
3. ජලාශවල ගැඹුර අඩුවීම
4. ජලය ජීවීන්ගේ පරිභෝජනයට නුසුදුසු තත්වයට පත්වීම

(8). ලවණ ප්‍රමාණය වැඩිවන අනුපිළිවෙලට ජලය පෙලගස්වා ඇති නිවැරදි පිළිතුර තෝරන්න.
1. කරදිය, මිරිදිය, කිවුල්දිය
2. මිරිදිය, කිවුල්දිය, කරදිය
3. කරදිය, කිවුල්දිය, මිරිදිය
4. කිවුල්දිය, කරදිය, මිරිදිය

(9). කලපුවල අඩංගු ජලය හඳුන්වන්නේ කුමන නමින්ද?
1. කරදිය 2. මිරිදිය 3. කිවුල්දිය 4. බොරදිය

(10). පහත සඳහන් ඒවායින් අසත්‍ය වගන්තිය තෝරන්න.
1. ජල දූෂණය අවම කිරීමට කඩිනම් පියවර ගත යුතුය.
2. මතුපිට ජලය දූෂණය වීම භූගත ජලය දූෂණය වීමට හේතු නොවේ.
3. ජල දූෂණය හේතුකොට ගෙන පරිභෝජනයට ගත හැකි ජල ප්‍රමාණය සීමිත වී ඇත.
4. ජල දූෂණය අවම කර, ජල සම්පත රැක ගැනීම අප සැමගේ යුතුකමකි. (ලකුණු 10 )

## II කොටස

01. පහත ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශය සඳහා (√) ලකුණ ද වැරදි ප්‍රකාශය සඳහා (×) ලකුණ ද යොදන්න.
1. ජලය ඝන, ද්‍රව හා වායු යන භෞතික අවස්ථා තුනෙන්ම පවතී. ( )
2. කලපුවල ජලය කරදිය ලෙස හැඳින්වේ. ( )
3. ලුණු ලේවා තුළදී මුහුදු ජලය වාෂ්පීභවනය කර ලුණු නිපදවාගනු ලැබේ. ( )
4. ජීවී දේහ තුල බහිස්සාවී මාධ්‍යයක් ලෙස ජලය වැදගත් වේ. ( )
5. ශාකවල පැවැත්මට ජලය අත්‍යවශ්‍ය නොවේ. ( )
6. ජල දූෂණය නිසා පරිභෝජනයට ගතහැකි ජලය ප්‍රමාණය අඩුවී ඇත. ( )
7. ශාකවල පැවැත්මට ජලය අත්‍යවශ්‍ය නොවේ. ( )
8. ලවණතාවය වැඩි වන විට ජලයේ ස්කන්ධය ද වැඩි වේ. ( )
9. පෘථිවි පෘෂ්ඨයේ ඇති ජලයෙන් 97%ක් මිරිදිය අඩංගු වේ. ( )
10. ප්‍රවාහන කටයුතු සඳහා ජලය භාවිතා කල හැකිය. ( )

(ලකුණු 10)

02. හිස් තැනට සුදුසු වචනය වරහන තුලින් තෝරා ලියන්න.

( දූෂණය, කිවුල්දිය, විජලනය, ද්‍රව, ග්ලැසියර්, සීමිත, ලවණ, හුමාලය, උල්පත්වලින්, භූගත )

i. අප බොහෝවිට ජලය ලෙස ව්‍යවහාර කරනු ලබන්නේ .............................. අවස්ථාවේ පවතින ජලයටයි.
ii. ධ්‍රැවාසන්න ප්‍රදේශවල ................................ ලෙස පවතින්නේ ඝන අවස්ථාවේ ඇති ජලයයි.
iii. ජල වාෂ්ප සහ ....................................... වායු අවස්ථාවේ පවතින ජලය සඳහා උදාහරණ වේ.
iv. පස තුල ඇති වැලි බොරලු, ගල් ආදිය අතර රැඳී ඇති ජලය ............................. ජලය ලෙස හැඳින්වේ.
v. ළිංවලින් හා ............................... අපට ලැබෙන්නේ භූගත ජලයයි.
vi. කලපුවල අඩංගු ජලය ......................................... ලෙස හැඳින්වේ.
vii. මිරිදියෙහි දියවී ඇති ................................ ප්‍රමාණය ඉතා ස්වල්පයකි.
viii. ශරීරයෙන් අධික ලෙස ජලය ඉවත්වීමෙන් ශරීරය ............................... වී මරණයට වුවද පත්විය හැකිය.
ix. ජලය ............................... සම්පතකි.
x. මිනිසාගේ අදූරදර්ශී ක්‍රියා හේතුවෙන් සීමිත සම්පතක් වන ජලය ................................... වෙමින් පවතී.

(ලකුණු 10)

03. සොබා දහමෙන් අපට දායාද කළ ප්‍රයෝජනවත් දෑ ස්වාභාවික සම්පත් ලෙස හැඳින්වේ. ජලය සීමිත ස්වාභාවික සම්පතකි.




ඉහත රූපයේ දක්වා ඇත්තේ පෘථිවි පෘෂ්ඨයේ ඇති ජල ප්‍රමාණයන්ය.

i. රූපයේ දැක්වෙන පරිදි වැඩිපුරම ජලය ඇත්තේ කොහිද?
ii. ජලය පවතින ප්‍රධාන ආකාර 3ක් ඔබ ඉගෙන ගෙන ඇත. ඒවා නම් කරන්න.
iii. ජලයේ විවිධ ප්‍රයෝජන 4ක් ලියා දක්වන්න.
iv. මිනිස් ක්‍රියාකාරකම් නිසා ජලය දූෂණය වනු ඇත.ජලය දූෂණය වන ක්‍රම 2ක් ලියන්න.
v. ජල දූෂණය යනු කුමක්ද?
vi. ඒවා අවම කර ගැනීමට යෙදිය හැකි උපක්‍රමයක් ඉදිරිපත් කරන්න.
vii. දූෂිත ජලය පානය කිරීමෙන් වැළඳිය හැකි රෝග 2ක් නම් කරන්න (ලකුණු 10)

04. පෘථිවි පෘෂ්ඨයෙන් 70%කට වැඩිය ජලයෙන් යට වී පවතී. නමුත් පරිභෝජනයට ගත හැකි ජලය ඉතා සුළු ප්‍රමාණයක් පවතී.

i. ජලය සීමිත සම්පතක් වන්නේ ඇයි දැයි කෙටියෙන් සඳහන් කරන්න.
ii. සෘජුව පරිභෝජනයට ගත නොහැකි ආකාරයේ ජලය සහිත ජල ප්‍රභව දෙකක් නම් කරන්න.
iii. ජලයේ විවිධ ප්‍රයෝජන 4ක් ලියා දක්වන්න.
iv. ජීවීන්ට ජීවය පවත්වා ගැනීම සඳහා ජලය ප්‍රයෝජනවත් වන අවස්ථා 4ක් ලියන්න.
v. නිවසේදී හා පාසලේදී ජලය අපතේ යා හැකි අවස්ථා 2ක් ලියා දක්වන්න.
vi. ඔබට කරදිය, මිරිදිය සහ කිවුල් දිය වෙන වෙනම සපයා ඇති නම් ඒවා වෙන් කර හඳුනා ගැනීමට සුදුසු ක්‍රමයක් යෝජනා කරන්න. (ලකුණු 10)